**පදියතලාව ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 04 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 12 දිනද විගණනයට ඉදිරිපත්කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට පදියතලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**-----------------------**

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී භාවිතා කල ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**---------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී භෞතික තොග නොතිබුණද මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ රු. 114,240 ක තොග වටිනාකමක් දක්වා තිබුණි.

(ආ) සභාව විසින් පවත්වාගෙන ගොස් තිබූ ලෙජර අනුව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම රු.146,966,860 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල ඉඩම් හා ගොඩනැගිලි ලෙස රු.589,237,227 ක් දක්වා තිබුණි. ඒ අනුව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම රු.442,270,367 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී මිලදී ගනු ලැබූ වටිනාකම රු.120,000 ක් වූ පරිගණක යන්ත්‍ර 02 ක් ගිණුම්ගත කර නොතිබීම නිසා ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2015 වර්ෂයේදී සභාව විසින් පුස්තකාලය සඳහා පොත් රාක්ක 18 ක් සවිකිරීම වෙනුවෙන් වැය කරන ලද රු.653,400 ක් ගිණුම්ගත කර නොතිබීම නිසා ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුලදී රු.1,268,707 ක් වැයකර ඉදිකල මීගස්වත්ත ළමා උද්‍යානයේ වෙළඳසැල හා ජංගම වෙළඳකුටි ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ඊ) සභාවට අයත් රු.9,241,884 ක් වටිනා කෘ කැබ් රථය හා ටිපර් රථය සභාවේ වත්කම් වශයෙන් ප්‍රාග්ධනිත කර නොතිබීම නිසා ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සභාවට අයත් බැකෝ ලෝඩරය හා කැබ් රථයේ සත්‍ය වටිනාකම රු.25,549,179 ක් වුවත්, ගිණුම්වලට ගෙන තිබුණේ රු.8,350,000 ක් වශයෙනි. ඒ අනුව ස්ථාවර වත්කම් රු.17,199,179 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.3 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසිවලට හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ප්‍රදේශීය සභා රීති මාලාව | |
| රීති 59 - 66 | සෑම වර්ෂයකම ආරම්භයේදී ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත බදු අය කලයුතු ආයතන හඳුනාගෙන ඒවා අය කරගැනීමට කටයුතු කලයුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. |
| රීති 65 | ආදායම් ලිපිකරු විසින් ගෙවීම් පැහැර හරින ලද අයගේ නාමලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| රීති 153 | ආදායම් හිඟ මුදල් පිළිබඳ ප්‍රකාශයක්, පී.එස්.07 ආකෘති පත්‍රය ප්‍රකාරව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| රීති 180 | මුදල්, ගබඩා හා ආදායම එකතු කිරීමේ කටයුතු භාරව ක්‍රියාකරන නිලධාරීන් තිදෙනා විසින් ඉදිරිපත් කල යුතු ඇපකර ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:9:1 ප්‍රකාරව ප්‍රජාපාදක සංවිධාන සඳහා ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් පිරිනැමීමේදී අදාල ප්‍රජාපාදක සංවිධානය විසින් සිදු කරන ලද මුළු කොන්ත්‍රාත් වල වටිනාකම රු.මිලියන 02 ක් නොඉක්මවිය යුතු අතර, එකවර කොන්ත්‍රාත් 03 කට වඩා වැඩි සංඛ්‍යාවක් නොකල යුතු වුවත්, සභාව විසින් නාවින්න ප්‍රජා මණ්ඩලය වෙත රු.3,899,946 ක් වටිනා කොන්ත්‍රාත් 12 ක් ප්‍රදානය කර තිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 (03.01) | සභාව සතු වාහන 12 ක් සම්බන්ධව ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.783,834 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,110,362 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.326,528 ක පසුබෑමක් පෙන්නුම් කෙරේ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------

පුනරාවර්තන ආදායම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කුලී ආදායම්, සේවා සඳහා ගාස්තු, යන මූලාශ්‍ර සියයට 28 සිට සියයට 33 දක්වා පරාසයක වර්ධනයක් ද, වරිපනම් හා බදු, බලපත්‍ර ගාස්තු, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් ආධාර යන මූලාශ්‍රවල සියයට 0.5 සිට සියයට 50 දක්වා පරාසයක  අඩුවීමක් ද පෙන්නුම් කරයි.

පුනරාවර්තන වියදම් විග්‍රහයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා, සැපයුම් හා උපකරණ, ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව, විශ්‍රාම වැටුප් යන මූලාශ්‍රවල සියයට 01 සිට සියයට 252 දක්වා වර්ධනයක් ද ගමන් වියදම්, ප්‍රවාහන සම්බන්ධතා හා අධාර යන මූලාශ්‍රවල සියයට 07 සිට සියයට 46 දක්වා පරාසයක අඩුවීමක් ද පෙන්නුම් කරයි.

### 2.3 ආදායම් පරිපාලනය

---------------------

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

-----------------------------------------------------------

සභාපතිවරයා විසින්  සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් | 2016 වර්ෂයේ තථ්‍ය ආදායම් | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 161,000 | 65,450 | - |
| කුලී | 3,929,300 | 2,333,900 | 79,100 |
| බලපත්‍ර ගාස්තු | 397,000 | 378,800 | - |
| සේවා සඳහා ගාස්තු | 3,075,904 | 1,404,218 | - |
| වරෙන්තු හා දඩ | 769,000 | 588,478 | 375,664 |
| වෙනත් ආදායම් | 202,550 | 318,426 | 24,115 |

**2.3.2 බදු කුලී**

**--------**

2005 වර්ෂයේ සිට ලැබිය යුතු මස්කඩ බදු කුලී මුදල වන රු.24,115 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

**2.3.3 වෙනත් ආදායම්**

**----------------**

2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව එක් දුරකථන කුළුණක් සඳහා අනුමැතිය ලබාදීමට අවම වශයෙන් රු.20,000 ක් බැගින් අයකල යුතු වුවද, සභා බල ප්‍රදේශයේ දුරකථන කුළුණු 08 ක් සඳහා රු.160,000 ක මුදලක් අයකර නොතිබුණි.

**2.3.4 මුද්දර ගාස්තු**

**--------------**

2010 වර්ෂයේ සිට ලැබිය යුතු එකතුව රු.161,282 ක මුද්දර ගාස්තුවක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා**

**-------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වාහන 07 ක් සඳහා ආදායම් බලපත්‍ර නියමිත දිනයට ලබාගැනීමට කටයුතු නොකිරීම නිසා දඩ මුදල් වශයෙන් රු.10,265 ක් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) සභාවේ සේවය කර ස්ථාන මාරු වීම් ලැබූ සේවකයන් දෙදෙනකුගෙන් 2013 වර්ෂයේ සිට අයවිය යුතු රු.13,960 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පදියතලාව සතිපොළ ඉදිරිපිට ඉහල මහලේ කඩකාමර 11 ක් සහ සේරන්කඩ පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 02 ක් ඉදිකිරීම් සමාලෝචිත වර්ෂය තුලදී සම්පූර්ණ කර තිබුණ ද, ඒවා බදුදී ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සතු වාහන 19 න් වාහන 12 ක් සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සභාව සතු කැබ් රථයක් අළුත්වැඩියා කටයුතු සඳහා 2014 ජූලි 19 දින සිට අඹතැන්න යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයට භාරදී තිබුණු නමුත්, එය අළුත්වැඩියා කරවා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඊ) සභාව විසින් භාවිතයට ගනු ලබන මුළු වපසරිය අක්කර 04, පර්චස් 103 ක් වූ ඉඩම් 05 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) සභාව සතුව පවතින වාහන 08 ක් අළුත්වැඩියා කලයුතු තත්ත්වයේ පැවතියද, 2017 ජූනි 13 දින වනතුරු අළුත්වැඩියා කිරීමකින් තොරව සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ඌ) නැගෙනහිර පළාත් සභාව හා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් සභාවට ලබාදුන් වාහන 09 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

සෘජු ශ්‍රම පදනම මත ව්‍යාපෘති ඉටු කිරීම සම්බන්ධයෙන් සිදුකල පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් 2015 වර්ෂය තුලදී ඉටුකරන ලද ව්‍යාපෘතීන් සඳහා අමුද්‍රව්‍ය හා යෙදවුම් මිලදී ගැනීමේදී අනුමත රේටයන් අනුව මිළ ගණන් හා සත්‍ය වශයෙන් දැරූ වියදම් අතර රු.2,162,590 ක අධිවැයක් දක්නට ලැබුණු අතර, එය දැරිය යුතු වියදමින් සියයට 41.8% ක ප්‍රතිශතයක් වේ.

| අයිතමය | සභාව දැරූ වියදම | සභාව දැරිය යුතු වියදම් | අතිරික්ත වියදම් |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වැලි | 1,117,300 | 864,200 | 253,100 |
| මැටල් | 3,179,925 | 2,415,375 | 764,550 |
| මෝටර් ග්‍රේඩරය | 3,037,800 | 1,892,860 | 1,144,940 |
| එකතුව | 7,335,025 | 5,172,435 | 2,162,590 |

(ආ) වෙළඳපොලේ පැවති උපරිම සිල්ලර මිල අනුව පිලර් ලීටරයක මිල රු.212 ක් වූ අතර, ඒ අනුව මිළදීගෙන තිබුණු පිලර් ලීටර 104 ට දැරිය යුතු උපරිම මුදල රු.22,048 ක් වුවත්, සභාව විසින් රු.76,200 ක් දරා තිබීම තුලින් රු.54,152 ක අධිවැයක් දරා තිබුණි.

(ඇ) ඉහත ව්‍යාපෘති ඉටුකිරීම සඳහා සිමෙන්ති මිලදී ගැනීමේදී එකම දිනයේදී මිළ ගණන් කිහිපයකට සිමෙන්ති මිළදීගෙන තිබූ බවට නිරීක්ෂණය වූ අතර, ඒ තුලින් සභාවට අවම වශයන් රු.53,660 ක පමණ අලාභයක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම සහ තථ්‍ය වියදම අතර සියයට 01 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයක් පැවැති බැවින්, අයවැය ලේඛනය සඵලදායි කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2016 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
|---|---|---|
| | -------- | -------------------------------------- |
| (අ) | ගිණුම්කරණය | වත්කම් ගිණුම්ගත කිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අයකර ගැනීම<br>ii. අතුරු ව්‍යාපාර පැනවීම<br>iii. ආදායම් ප්‍රභව හඳුනාගැනීම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | එකඟතාව අනුව වැඩ ඉටු කිරීම |
| (ඈ) | ගබඩා පරිපාලනය | ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි ආකාරයට භාණ්ඩ ගබඩා කිරීම |
| (ඉ) | වත්කම් පාලනය | ස්ථාවර වත්කම්වල අයිතිය පවරා ගැනීම |